# තිත්තවැල්ල ග්‍රාමයේ මැටි මෙවලම් කර්මාන්තය පිළිබඳව අධ්‍යනයක්

එම්.එම්.එන්.එස්. විජේරත්න

පුරාවිද්‍යා හා උරුම කළමනාකරන අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Nadee123a@gmail.com

**මුඛ්‍ය පද** - කුඹල් කර්මාන්තය, තිත්තවැල්ල ග්‍රාමය, කුඹල්කරුවන්

**හැඳින්වීම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කුඹුක්වැව, තිත්තවැල්ල ගම්මානය ස්වභාව සෞන්දර්යයෙන් අනූන ගම්මානයකි. මෙම ගම්මානය ප්‍රසිද්ධත්වයට පත් ව ඇත්තේ කුඹල් කර්මාන්තය පාදක කොටගෙන ය. 1956 වර්ෂයේ සිට වර්තමානය දක්වා පුරා වසර 66ක් මුළුල්ලේ කුඹල් කර්මාන්තය සිය ජීවන වෘත්තිය වශයෙන් පැවත එන්නේ පරම්පරානුගතවය. මෙම ග්‍රාමයේ ගැමියන් මෙකී සම්ප්‍රදායික ශිල්ප ක්‍රමයට පණ පොවන්නේ දැඩි උනන්දුවකින් බව කිව යුතු ම කරුණකි. මැටි කර්මාන්තය ඉතාම පැරණි සාම්ප්‍රදායික කර්මාන්තයකි. කුඹල් ප්‍රජාව හා කුඹල් කර්මාන්තය පිළිබඳව ද විවිධ තොරතුරු අපට හමු වුණ ද මැටි කර්මාන්තය හා සබැඳි තාක්ෂණය ග්‍රාමීය වශයෙන් එකිනෙකට වෙනස් ය. මෙම අධ්‍යනයෙන් අපේක්ෂා කරනුයේ මැටි බඳුන් නිෂ්පාදනයේ යෙදෙන එක් ග්‍රාමයක් තෝරාගෙන එහි ග්‍රාමීය ජනයා පිළිබඳව අධ්‍යනයක් කරමින් කුඹල් කර්මාන්තය පිළිබඳව පූර්ණ වශයෙන් අධ්‍යනයක නියැලීම ය. මෙහි දී කුඹල්කරුවන් මැටි මෙවලම් නිර්මාණය කිරීමේ දී භාවිතා කරනු ලබන ක්‍රමවේද, අමුද්‍රව්‍ය සොයා ගන්නා ස්ථානයේ පටන් මෙවලම් නිර්මාණය කර එය අලවිය තෙක් ඔවුන් භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රමවේද තිත්තවල්ල ග්‍රාමයේ කුඹල් ජනයා ඇසුරින් ඉදිරිපත් කිරීම මෙන් ම ඔවුන්ගේ සාමාජීය තත්ත්වය පිළිබඳව ද අධ්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යනයේ දී මා හට පූර්ව අධ්‍යයනය කිසිවක් හමු නොවූ අතර මෙහි දී එම ග්‍රාමයට ගොස් මෙම කර්මාන්තය පිළිබඳ ව, තාක්ෂණය පිළිබඳ ව හා ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ ව මා විසින් සමීප ව නිරීක්ෂණය කරමින් හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ කුඹල්කරුවන්ගෙන් සිය ඥාණය හා දැනුම පිළිබඳ ව තොරතුරු ලබා ගන්නා ලදි. මෙකී ක්‍රමයන් ඔස්සේ මෙම අධ්‍යනය සිදු කර ඇත. මෙම අධ්‍යනය සඳහා අහඹු වශයෙන් තෝරා ගන්නා ලද පවුල් කිහිපයක් ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

අතීතයේ සිට වර්තමානය දක්වා මෙම ග්‍රාමයෙහි ගැමියන්ගේ ජීවනෝපාය වන්නේ කුඹල් කර්මාන්තයයි. වර්තමානය වන විට මෙම කුඹල් කර්මාන්තයේ නියැලී සිටින්නේ දෙවැනි හා තුන්වැනි පරම්පරාවේ සාමාජිකයින් පමණි. මෙම ග්‍රාමයේ කුඹල්කරුවන් විසින් නිර්මාණය කරනු ලබන්නේ වළං, රතු මැටිවලින් නිර්මාණය කරන විසිතුරු භාණ්ඩ, ගබඩා බඳුන්, පිළිගැන්වීමේ බඳුන් හා ලිප් පමණි. මෙම කුඹල්කරුවන් සිය නිර්මාණයන් කිරීම සඳහා කොයිල් වැඩ ක්‍රමය හා සකපෝරු වැඩ ක්‍රමය යන ක්‍රම ද්විත්වය භාවිත කරනු ලබයි.

තිත්තවැල්ල ප්‍රදේශයේ ජීවත් වන කුඹල්කරුවන් සිය කර්මාන්තයට අවශ්‍ය මැටි සපයාගනු ලබන්නේ සිය ප්‍රදේශය ආසන්නයේ ඇති වැව්වලිනි. තම ග්‍රාමයට ආසන්න කිලෝමීටර 10-15 ත් අතර ප්‍රදේශවලින් මොවුන් මැටි සපයා ගනියි. මෙම කුඹල්කරුවන් බොහෝ විට මැටි සපයාගනු ලබන්නේ වැල්ලව නම් ප්‍රදේශයෙනි. මෙහි දී මැටි ලබා ගැනීම සඳහා මොවුන් දැඩි වෙහෙසක් දරන අතර වාර්ෂික ව ඔවුන්ට අවශ්‍ය මැටි ප්‍රමාණය සිය නිවෙස්වල ගබඩා කර ගනියි. සාමාන්‍ය වශයෙන් සෑම වසරක ම මැයි සහ අගෝස්තු යන කාල සීමාව අතර

මොවුන් මැටි සපයා ගැනීම සිදු කරයි. තිත්තවැල්ල ග්‍රාමයේ කුඹල්කරුවන් භාණ්ඩ නිෂ්පාදනය කරන විට ඔවුන්ට අලුතින් ම සපයා ගන්නා ලද මැටි හමුවන්නේ නැත. එයට හේතුව වන්නේ ඔවුන් වසරකට ම අවශ්‍ය වන මැටි ප්‍රමාණය එක් වරම සපයා ගන්නා බැවිනි. මෙම පුද්ගලයින් විශ්වාස කරන්නේ කාලයක් තිස්සේ ගබඩා කර ලබා ගන්නා මැටි, භාණ්ඩ නිෂ්පාදනයට වඩාත් ම උචිත බවයි. මන්දයත් ඇතැම් විට මෙම මැටි අතර විෂ රසායනික ද්‍රව්‍යය ආදී අහිතකර ද්‍රව්‍යය පවතී නම් ඒවා භාණ්ඩ සාදා පිලිස්සීමේ දී නැවත මතු වී භාණ්ඩවල වර්ණයට හා ගුණාත්මකභාවයට හානි සිදුවිය හැකි බැවින් කාලයක් තිස්සේ මැටි ගබඩා කර භාවිතා කිරීමෙන් අනතුරු ව එම විෂ නැතිවී යාමට හෝ ජීර්ණය වීමට අවස්ථාව පවතින බැවිනි.

අදාළ ශිල්පීය උපක්‍රම භාවිතයට ගනිමින් කුඹල්කරුවන් සිය භාණ්ඩ නිෂ්පාදනය සඳහා වළං, ලිප්, මල්පෝච්චි, පාත්‍රා, කුරුලුකූඩ, ගුරුලේත්තු, ජලය ගබඩා කරන බැරල්, වතුර බෝතල්, කෝප්ප, ජල පොකුණු, කරඬු යනා දී විවිධ වූ ආකෘතීන් තෝරාගෙන ඇත. එම ආකෘතීන් තෝරාගෙන ඇත්තේ වෙළඳපොළ ඉල්ලුම මත ය. එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී අත් සකපෝරුව, පා සකපෝරුව, විදුලි සකපෝරුව, ක්‍රසර් මික්ස්, ජිගර් යන්ත්‍රය, පග්මිල් යන්ත්‍රය, පිල්ටර් යන්ත්‍රය, කූර, කැටයම් කපන ලද ටූල්, පත්ත, ප්ලාස්ටික් බට කැබැල්ලක්, බුරුසු, කුඩා භාජන, උදැල්ල, ගල, විල්බැරෝව, කූඩය, බෝල් වීල් යන්ත්‍රය හා මික්ෂර් යන්ත්‍රය යන උපකරණ භාවිතා කරන ලදි. මෙලෙස සාදා ගනු ලබන මැටි භාණ්ඩ පිළිස්සීමේ දී මොවුන් විසින් දර පෝරණු හා චිමිනි පෝරණු යන පෝරණු දෙවර්ගය උපයෝගී කර ගනියි. මෙලෙස අදාළ උෂ්ණත්වයන් යටතේ පුළුස්සා ගන්නා ලද මැටි භාණ්ඩ අලෙවි කිරීම ප්‍රධාන කාර්යය බවට වර්තමානයේ පත් ව ඇත. මෙම ග්‍රාමයේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩවල වෙළඳපොළ පිළිබඳ ව අවධානය යොමු කරන විට මෙම භාණ්ඩ අලෙවි කිරීම සඳහා තම ගම්මානයේ මහා මාර්ගය දෙපස වෙළඳසැල් කිහිපයක් ම පවතියි. ගම අභ්‍යන්තර සිටින නිෂ්පාදනකරුවන්ගේ නිෂ්පාදන පවා මෙහි දී අලෙවි වනු ඇත. මීට අමතර ව මෙම කුඹල්කරුවන් වෙත පැමිණ භාණ්ඩ මිළ දී ගැනීම සඳහා විවිධ පළාත්වලින් පැමිණි පළාත් නියෝජිතයන්, වෙළඳසැල් හිමිකරුවන් හෝ විවිධ ආයතන මඟින් පැමිණ මෙම භාණ්ඩ මිළ දී ගෙන ඔවුන් නැවත අලෙවි කරනු ලබයි. මීට අමතර ව කුඹල්කරුවන් විවිධ පළාත්වලට ගොස් සිය භාණ්ඩ වෙළඳසැල් වෙත ප්‍රවාහනය කරනු ලබයි. මේ අනුව දිවයිනේ සියලු ම ප්‍රදේශ වෙත මෙම භාණ්ඩ බෙදාහරිනු ලබයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**(සම්මුඛ සාකච්ඡා)**

ඩී. ඉසුරු ප්‍රසන්න කුලතුංග මහතා, (20), 2022/11/02

එම්. ශ්‍රියාණි මාදම්පිටිය මහත්මිය (48), 2022/11/02

ඩී. නිහාල් කුලතුංග මහතා (53), 2022/11/02